**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රිය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2018 දෙසැම්බර් 31 දිනට වූ විශ්‍රාම වැටුප් වගකීම එවැනි ආයු ගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව රු.3,590,887,004 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2007 වර්ෂයේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ | විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයුගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතුය. |

## 1.5.2 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විශ්‍රාම වැටුප් වගකීම රු. 3,590,887,004 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 8.9 ක වැඩි වීමකි. මෙම යෝජනා ක්‍රමයේ ධීවර විශ්‍රාම වැටුප් සමුච්ඡිත අරමුදලෙහි 2018 දෙසැම්බර් 31 දිනට සෘණාත්මක තත්ත්වය රු.2,947,927,045 ක් දක්වා වැඩි වී තිබීමෙන් එහි අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.තවද ඉදිරි වර්ෂයන් තුළදී මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය විය හැකි බැවින් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කොට මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනාගත වගකීම ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය වාර්තා වල හෙළිදරව් කර ඇත. මෙම යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයක් නොමැති රාජ්‍ය සහනාධාරය මත පදනම් වූ යෝජනා ක්‍රමයක් බැවින් මෙලෙස අනාගත වගකීම ඉහළ ගොස් ඇත. මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දැනටමත් පත්කර ඇති විද්වත් කමිටුවේ නිර්දේශ ලද විගස ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කොට මූල්‍ය ශක්‍යතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | ස්වයං මූල්‍ය පදනමකින් පවත්වාගෙන යා හැකි වන පරිදි ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |
| 16(2) වගන්තිය | යම් දායකයෙකු වෙත නිකුත් කර ඇති සහතික යටතේ ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය. එසේ නොදැන්වීම හේතුවෙන් වාරික නොගෙවීම මත අවලංගු වූ සහතිකයක් නැවත වලංගු කරවා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සාමාජිකයන් 35 දෙනකුට තිබූ අවස්ථාව මගහැරී තිබුණි. | අඛණ්ඩව වාරික 10 ක් නොගෙවූ දායකයින්ගේ දායකත්වය අහෝසි වන බව යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ ධීවරයින්ට පූර්ව දැනුම් දීමක් කර ඇත.<br>තවද, එසේ දායකත්වය අවලංගු වීම පිළිබඳව දැනුම් දීම ධීවර දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, දායකත්වය අවලංගු වූ ධීවරයින්ට ධීවර දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මගින් නව දායකයකු ලෙස නැවත ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට හැකියාව ඇත. | ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දැන්වීමක් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 20 වගන්තිය | මණ්ඩලයේ උපදේශක කාරක සභාව, සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද 2018 වර්ෂය වෙනුවෙන් සාමාජිකයන් නව දෙනෙකු පමණක් පත්කර තිබුණි. | ගොවි ධීවර ප්‍රජාව වෙනුවෙන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර ඇත. එහිදී තවදුරටත් මෙම යෝජනා ක්‍රම විශ්ලේෂණය කර අමාත්‍ය මණ්ඩලයට උපදෙස් ලබාදීම සඳහා විද්වත් කමිටුවක් පත්කර ඇත. එයට සමගාමීව මණ්ඩලයේ උපදේශක කාරක සභාවේ මේ වන විට පත්කර නොමැති සාමාජිකයින් පත් කොට එම කාරක සභාව රැස්කර මෙම යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. | සාමාජිකයන් පත්කර නිසි පරිදි රැස්වීම් පැවැත්වීමට කටයුතු කල යුතුය. |
| (ඇ) 7 (i) වගන්තිය | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ධීවර විශ්‍රාම වැටුප් සඳහා හිමිකම ඇති නමුත් විශ්‍රාම වැටුප් සකස්කල දින සිට ගෙවීම් සිදු කර තිබුණි.එම නිසා 2011 ජනවාරි සිට විශ්‍රාම ගිය ධීවරයන් 95 දෙනෙකුට 2017 ජනවාරි සිට විශ්‍රාම වැටුප් ගණනය කර ගෙවීම් කර තිබුණද 2011 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාලව ගෙවිය යුතු රු.2,793,811 ක විශ්‍රාම වැටුප් ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | දිගුකාලයක් ධීවර විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම පමාවී ඇති ධීවරයින් හට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේදී එසේ ප්‍රමාද වීමට හේතු වූ කාරණා සොයා බැලීමෙන් පසු ගෙවීම් කිරීමේදී පැරණි හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිසා මෙම තත්වය උදාවී ඇත. යුද්ධය පැවති දිස්ත්‍රික්කයන්ගේ ධීවර විශ්‍රාම වැටුප් අයදුම් කිරීමේදී විශාල ප්‍රමාදයන් දක්නට ලැබුණු බැවින් එසේ ප්‍රමාද වීමට හේතු කාරණා ග්‍රාම නිළධාරී හා ප්‍රාදේශීය ලේකම් ඇතුළු දිස්ත්‍රික් රාජ්‍ය නිළධාරීන්ගෙන් ඒ පිළිබඳව තහවුරු ලබාගැනීමෙන් පසු අදාල මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | හිඟයක් ඇති නොවන පරිදි අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතුවලින් රු.2,247,551 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 28,891,441ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,643,890 ක එනම් සියයට 92 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේදී ලංකා බැංකුවට එරෙහිව පවරා තිබූ නඩුවක් මණ්ඩලයට වාසි සහගත ලෙස තීරණය වීමෙන් ලැබිය යුතුව තිබූ මුදලින් කොටසක් වන රු.37,672,911 ක් ඉකුත් වර්ෂයේ දී මණ්ඩලයට ලැබීම ඉහත අතිරික්තය ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂය තුළ දී ධීවර නව බඳවා ගැනීම් 100 ක් ලෙස දක්වා තිබුණ ද තත්‍ය බඳවා ගැනීම් සිව් දෙනෙකු පමණක් විය. එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 97 ක දුරස්වීමකි. එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 97 ක පිරිහීමකි. | නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස්කොට විශේෂඥ කමිටුවකට යොමු කිරීමෙන් උපදෙස් ලබාගත යුතු බවට අතිගරු ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති බැවින්, එම කමිටුව රැස්වීමෙන් පසු නව රජයේ ප්‍රතිපත්තියට අනුව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යූහ ගතකොට නව බඳවාගැනීම් සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුණ පරිදි සාමාජිකයන් අඛණ්ඩව බඳවාගැනීමට කටයුතු කල යුතුය. |